**නිපුණතාවය :-** ව්‍යවසායකත්වය හා එහි වැදගත්කම අවබෝධ කොට ගෙන ව්‍යවසායකයකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම :-** -ව්‍යවසායකත්ව සංකල්පය විග්‍රහ කරයි.

( පෙළ පොතේ පිටු අංක 07 සිට 16 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න)

(01) ව්‍යවසායකයකු සතු මූලික ගති ලක්ෂණ 06 ක් දක්වන්න.

(02) 'නිර්මාණශීලීත්වය' යනු කුමක්ද ?

(03) ඔබගේ පාසල් පරිසරය තුළ පවතින ගැටලු 05 ක් හඳුනාගෙන එම ගැටලු සඳහා ඔබට ඉදිරිපත්කළ හැකි නිර්මාණශීලි විසඳුම් ඉදිරිපත් කරන්න.

| ගැටලුව | විසඳුම |
|---|---|
| | |

(04) පුද්ගලයකු සතු 'නිර්මාණශීලිත්වය' වර්ධනය කර ගත හැකි මාර්ග සහ බාධාකාරී වන සාධක 04 බැගින් දක්වන්න.

(05) 'නවෝත්පාදනය' ව්‍යවසායකයන් සතු සුවිශේෂී ලක්ෂණයකි. 'නවෝත්පාදනය' යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(06) 'නවෝත්පාදනය' සිදුවන ආකාර හතර දක්වන්න.

(07) 'නවෝත්පාදනය' සඳහා පදනම්වන මූලාශ්‍ර 05 ක් දක්වන්න.

(08) දී ඇති පැහැදිලි කිරීමට වඩාත් උචිත ව්‍යවසායකත්ව ගති ලක්ෂණය දක්වන්න.

i. ගැටලු හා අවස්ථා දෙස බලා ඒවා විසඳීමට නව අදහස් සහ ක්‍රියාමාර්ග ගැනීම.

ii. පරිසරයේ වෙනස්වීම් කල්ඇතිව තේරුම්ගෙන ව්‍යාපාරයක් බවට පත්කර ගැනීම.

iii. අනෙකුත් අයගේ අදහස් ගරුකරන නමුත් සැමවිටම නිදහස් අදහස් දැරීම.

iv. පුද්ගලයාගේ නිර්මාණශීලී අදහස් ප්‍රයෝජනවත් දෙයකට යෙදවීම.

v. අනාගතයේදී සාර්ථක කර ගැනීමට වෙර දරන සිහිනයයි.